# අපේ ගීතිකා පොත 5+



## ශ්‍රී ලාංකීක කතෝලික සංඝය

# 1

ආරම්භය සමිඳුන් වේ – අවසානය සමිඳුන් වේ //
ඔබ හැරදා අපට සදා – ජීවිතයක් නොමැත මෙදා //

අප ශක්තිය සමිඳුන් වේ – අපේ බලය සමිඳුන් වේ //
ඔබ හැරදා අපට සදා – ජීවිතයක් නොමැත මෙදා //

අපේ සවිය සමිඳුන් වේ – අපේ ගමන සමිඳුන් වේ //
ඔබ හැරදා අපට සදා – ජීවිතයක් නොමැත මෙදා //

අප මාවත සමිඳුන් වේ – අප ජීවය සමිඳුන් වේ //
ඔබ හැරදා අපට සදා – ජීවිතයක් නොමැත මෙදා //



# 2

සමිඳුන් මැව්ව දිනය අදයි
අපි ප්‍රීති වෙමු – තුති ගීතිකා ගයමින් //

සතුටද කඳුලද අපට ලැබෙන්නේ – සමිඳුන්ගෙන්මයි
මේ සැමදෙයක්ම අපට කියන්නේ – සමිඳුන් අප සමගයි

අඳුරද එළියද අපට ලැබෙන්නේ – සමිඳුන්ගෙන්මයි
සැපතද විපතද අපට ලැබෙන්නේ – සමිඳුන්ගෙන්මයි

ජයද පැරදුමද අපට ලැබෙන්නේ – සමිඳුන්ගෙන්මයි
මේ සැම තුළින්ම අපට පෙනෙන්නේ – සමිඳුන් ආදරයයි

සුව සහනය නිති අපට ලැබෙන්නේ – සමිඳුන්ගෙන්මයි
තිර ඇදහිල්ලට සවිය ලැබෙන්නේ – සමිඳුන්ගෙන්මයි



# 3

පසසමි සමිඳේ මාගේ දිවියේ
මා ගත් සැම සුසුමක් ගානේ
ඔබගේ කරුණා මාගේ දිවියේ
සැම මොහොතෙම මා හා වූයේ



තුති දෙමි සමිඳේ හිරු නැග උදයේ
නැවතත් බසිනාතුරු අවරේ
බැස හිරු අවරේ නැවතත් උදයේ
නැගෙනාතුරු පසසමි සමිඳේ

ඔබේ කරුණාවෙන් සැම මොහොතෙම මා දිවියේ
තුති දෙමි සමිඳුනි වෙනුවෙන් මා ලැබූ සැමදේ
අයදිමි වරයක් සමිඳුනි පතුලෙන් මහදේ
ඔබ වත මට පෙන්වනු මැන අවසන් මොහොතේ

අයදිමි සමිඳේ පියුමේ පෙති සේ
ඔබ හා එක්වී සිටින ලෙසේ
ඔබගේ කරුණා සුවඳින් මාගේ
දිවියම සුවඳින් පිරෙන ලෙසේ

අයදිමි සමිඳේ නොපැකිල ඔබගේ
ජය මග යන්නට හැකිවනසේ
ඔබගේ දිවියේ එලියෙන් මාගේ
ජීවිත ඝනඳුර පහවන සේ

## 4

එම් මම  හිමි සඳුනේ
පූදසුන වෙත ඔබගේ
ඔබතුම මෙන් මගේ
දිවි පුද කරනට
දන වෙනුවෙන් ඔබගේ
සවිය දෙන්න සමිදේ

සමිඳුනි ගනු මැන දිවි මල මාගේ
නටුවෙන් ගිලිහී ඔබ වෙත පිදෙනා
සුසුදු අතින් පොඩි කරලනු මැන එය
සුවඳ දසත නික්මෙන ලෙසිනා //

පැගෙන පොඩි වෙත දිලිඳුන් වෙත ගොස්
විමුක්තියේ සුභ අස්න දෙසන්නට
විලංගු ගලවා වහලුන් මුදවා
පෙළෙන සතට සුව සෙත සලසන්නට //



## 5

සමා වන විරුවාණනි
සමා වන සොයුරාණනි
සමා වීමේ උතුම් කම මට
දෙනු මැනව සමිඳාණනි
මගේ කිතු සමිඳාණනි




මගේ වරදින් මා මිදෙන්නට
මගේ වරදම මට පෙනේවා
අනුන්ගේ ඇද මට පෙනෙද්දී
මගේ දැසම වැසේවා
ගල් ගහන්නට මුගුරු ගන්නට
මගේ ගල් හිත ඉඩ නොදේවා
පව්වුටු සැම හට කුළුණු පෑ හිමි
සුහද බව මට ලැබේවා

එකට එක කිසි විටෙක නොකරම
සමා වන හිත මට ලැබේවා
මගේ හොඳ නම නසන සැම හට
මගේ හොඳ හිත පිදේවා
ගල් ගසද්දී බැන වදිද්දී
සමාවම ම'සිතට නැගේවා
සතුරු සැම හට දයා පෑ ඔබ
සුහඳ බව මට ලැබේවා



## 6



සිත හැරී මා එනතුරා
ඔබ බලා සිටියා
කෙලෙස් බව මා ඉවත නොදමා
සිප වැළඳ ගත්තා

පියාණෙනි මා අසරණයි ///
වන්න අනුකම්පා //

සතුට සම්පත සොය සොයා
එහිම වැනසීලා
එකම සම්පත ඔබම පමණයි
මා වටහා ගත්තා

නෙතට කඳුළැලි මතුවුනේ
කුසට ගිනි දැනිලා
පියාණන් මගේ සිතට නැගුනේ
දිළින්දෙක් වූ දා

මගුල් බොදුනක් සැරසිලා
කිම අරුත නොදැනේ
පියාණෙනි ඔබ හැර දමාලා
යළිත් යන්නේ නෑ



# 7

මාගේ වරදින් පව් කළෙමි
ගැඹුරු පවින් සිත පිරෙව්වෙමි
ක්‍රියා වචන සිතුවිලි දකිමි
ඒ සැම ගැන මා තැවෙන්නෙමි

සමිඳුනි මරියනි සුරදූතයෙනි අමා
මුනිවරුනි සොහොයුරෙනි
ගැති මා යදිමි කමා

මරියනි යදින්න මා උදෙසා
සමිඳුන් දයාව ලැබෙන ලෙසා
මුනිවරුනි ඔබ යැඳුම නිසා
දෙවිඳුන් දයාව ලබමි තොසා



# 8

ඔබෙ අතැඟිලි මත රැඳී සිටින්නට
සමිඳුනි මට ඉඩ හරිනු මැනේ

අපේ දුබලකම තුල එවිටයි
ඔබේ ප්‍රබල කම දිස්වන්නේ
අප අසරණකම තුල එවිටයි
ඔබේ ප්‍රබල කම දිස්වන්නේ

අප නැති බැරි කම තුල එවිටයි
ඔබේ ප්‍රබල කම දිස්වන්නේ
අපේ පරාජය තුල එවිටයි
ඔබේ ප්‍රබල කම දිස්වන්නේ



## 9

ජේසුනි මගේ හදින් ආදරේයි
ජීවිතේ තවත් වරක්
මා මෙසේ හඬා වැටී අයදින්නෙමි මා ඔබෙන් සමා

මිරිඟුවක් හඹා යමින් නිමක් නොමැති වැලිකතරක//
පිපාසයට මා සොහනා දිය බිඳ ඔබවේ සමිඳුනේ...

සිසිල් දිය බිඳක් සොයා දිවයන මගේ ජීවිතයට//
මඳ පවනක් වී සිසිලස ගෙන දෙනු වැනවී සමිඳුනේ...



# 10




ඔබ මගේ ජීවිතේ ඉල්ලන විටදි
ඔබේ සේවය සඳහා
පැන යන්නයි මගේ ගත කැමැති
සමිඳුනි වන්න සමා

ගත පරදා
මගේ සිත පුබුදා
දෙමි මම සමිඳුනි
මගේ මුළු ජීවිතේ
ඔබේ සේවය සඳහා //

ඔබ මගේ පායුග ඉල්ලන විටදී
ඔබේ සේවය සඳහා
ලස්සන මිරිවැඩි – සොයමින් වෙහෙසෙමි
සමිඳුනි වන්න සමා //

ඔබ මගේ නෙත්යුග ඉල්ලන විටදී
ඔබේ සේවය සඳහා
කුංකුම අන්ජන – සොයමින් වෙහෙසෙමි
සමිඳුනි වන්න සමා

ඔබ මගේ කටහඬ ඉල්ලන විටදී
ඔබේ සේවය සඳහා
හරසුන් හිස්බස් – දොඩමින් වෙහෙසෙමි
සමිඳුනි වන්න සමා



## 11

දිය සොයනා
මුව පොව්වකු සේ මගෙ
ආත්මය ඔබව සොයයි
මා හද නිරතුරු ඔබව පතයි
ඔබ නමදින්නට ආසයි

ජේසුනි ඔබ මගේ
ශක්තිය වේ – මගේ
ආත්මය සමිඳුට යටහත් වේ
මා හද නිරතුරු ඔබව පතයි
ඔබ නමදින්නට ආසයි

ඔබ පමණයි මා සංසිඳුවන්නේ
ඔබමයි ප්‍රීතිය දෙන්නේ
රන්රිදී වලටත් වැඩියෙන් ඔබහට
ආදරෙයි ජේසු

ක්‍රිස්තු රජාණෙනි ඔබ මගෙ මිතුරා
ඔබ මගෙ සොහොයුරා
කිසි කෙනෙකුට කිසි දෙයකට
වැඩියෙන්
ආදරෙයි ජේසු

## 12

ගියදෝ දුරස් වෙන්න
ආසයි මටත් ඉන්න
ආයෙත් සිතින් ළං වෙලා
ජේසු අතින් අල්ලලා //

තනු ගීත නංවන්න හඬ ස්වර මට දුන්නු
දහසක් සවන් සනහලා //
දෙනවාදා පෙරසේම කරුණා දයා සෝම
පෙර පාප වලලා දමා //
ආයෙත් සිතින් ළං වෙලා

සැනසුම් ඔබෙන් ලැබුව රාවේ සිතේ රැඳුණ
ඇත තාම සිතුවම් වෙලා //
ඔබ ඇත වෙනවාද මා ඇත යනවාද
පෙන්වන්න කරලා සමා //
ආයෙත් සිතින් ළං වෙලා



# 13

මා බලවත් කරණා සමිඳාණන් තුල
සියල්ල කල හැකි වේ //

නැත මා සිතේ සැකයක් බියක්
සමිඳෝ බලවතාණෝ //
රැක ගන්න මා සමිඳේ
ගෙවෙනා සැම මොහොතේ //

පිසදා කඳුළු සනසා අපව
මුදවා සැම තපුරෙන් //
සමිඳා ඔබයි තිබඳේ
තුතිවේ ප්‍රශංසා වේ //

ගිතිදැල් හදේ සුසුමන් සිතේ
තිවනා සමිඳු ඔබවේ //
ඉඩදෙන්න මට සමිඳේ
රැඳවෙන්න ඔබ සුරතේ //






## 14

මම නුඹ කිසිදා අත් නොහරින්නෙමි
නුඹ මා තුළ සදා රඳවා ගන්නෙමි
ඔබ පසු පස මා සැමදා ඉන්නෙමි
ඔබ අසලින්ම මා සදා රැඳෙන්නෙමි

පිළිතුරු නොලබා අසරණ වූ විට
වෙනතක හැරුනෙමි
මුව පොව්වකු සේ මිරිඟුව පසුපස
හතිලා දිව්වෙමි
පිළිතුරක් නොදී බොහෝ කලක් මා
නිහඬව සිටියෙමි
එහෙත් නුඹ කෙරෙන් මගේ මුහුණ මා
සඟවා නොගත්තෙමි

දෙපා වාරු නැති මොහොතේ තනිව
දුක මැද හැඬුවෙමි
ඉවසුම් නොමැතිව දසතම දිව ගොස්
හතිලා වැටුනෙමි
දෙපා වාරු නැති මොහොතේ මා නුඹ
ඔසවා ගත්තෙමි
නුඹටත් රහසින් නුඹ අසලම සිට
නුඹ සව්මත් කලෙමි

## 15

ඔබේ අත දිගු කරලා – මගෙ අත් මත තියලා
ජේසුනි මගේ දෑත – ඔබෙ සේවෙට ගන්න

ඔබේ අත දිගු කරලා – මගේ පා මත තියලා
ජේසුනි මගේ දෙපා – ඔබ සේවෙට ගන්න
ඔබේ අත දිගු කරලා – මගේ නෙත් මත තියලා
ජේසුනි මගේ දෙනෙත – ඔබ සේවෙට ගන්න

ඔබේ අත දිගු කරලා – මගේ දෙතොලට තියලා
ජේසුනි මගේ වචන – ඔබෙ සේවෙට ගන්න

ඔබේ අත දිගු කරලා – මගේ හිස මත තියලා
ජේසුනි මගේ නුවන – ඔබෙ සේවෙට ගන්න

ඔබේ අත දිගු කරලා – මගේ පපුවට තියලා
ජේසුනි මගේ හුස්ම – ඔබ සේවෙට ගන්න



# 16

ජේසු ආදරෙයි ජේසු //
කල්වාරි  කන්දේ ඔබ දිවි පිදුවේ
මා පාපි වූයේ දහදුක් ඔබ වින්දේ
ජේසු ආදරෙයි ජේසු //

ආදරේ කියන්න දන්නේ නෑ
ආදරේ කරන්න දන්නේ නෑ – මට
ආදරේක පහස ලැබුනේ නැහැ
ජීවිතේද අගය දැනුනේ නෑ – ඒත්
ආදරේ වටහා ගනී මෙ මා
ඔබේ ප්‍රේමයේ යාගයෙන් තමා
ජේසු ආදරෙයි ජේසු //



රන් රිදී මුතු මැණික් එපා
තාව කාලිකයි ලොවේ
සුවේ එපා
සුවඳ ගල්වමින් ඔබේ දෙපා
මට ඔබෙන් වෙන්ව
යන්න දෙන්න එපා
ආයේ පාප ජීවිතේ එපා
මගේ හදට එළිය වී වෙනු කමා
ජේසු ආදරෙයි ජේසු //



## 17

රන් කහවනු පොදි සිතිඳු කසී සළු
එපා එපා ජේසු
මිණි මුතු අභරණ දිලෙන කසුන් වැල්
සොයන්නෙ නැහැ ජේසු

වෙහෙසුණු හදකට සැනසුම දෙන්නට
යුතුමග සොයන්නෙමි
දුබලවූ සිතකට සවියක් දෙන්නට මගෙ සිත යොදන්නෙමි
රසයෙන් සපිරුණු මිහිරි රජ බොදුන් එපා එපා ජේසු
සුවයෙන් සුවදෙන සුවඳ මල් යහන්
සොයන්නෙ නැහැ ජේසු

කුසයට අහරක් නොලැබ විඳින දුක
දැක පෙර මගට යමි
ඇඳිවත අහිමිව සලන කඳුළු පිස සනසා ඉවත යමි
රන් සිහසුන් මත වැජඹෙන තනතුරු එපා එපා ජේසු
හිස සරසන්නට කුමර පළඳනා
සොයන්නෙ නැහැ ජේසු

පාලු මගේ හද ජේසුට වඩිනට සුව අසුනක් කරමි
දිලිඳු මගෙ සිත ජේසුගේ සුදු හිත සමගින් එක් කරමි
රන් කහවනු පොදි සිතිඳු කසී සළු එපා එපා ජේසු
මිණි මුතු අභරණ දිලෙන කසුන් වැල්
සොයන්නෙ නැහැ ජේසු //

# 18

ඔබ අමතන මා ඔබෙ දෙව්දුන් වෙමි
සුභ වදන දෙසන්නට ඔබ කැඳවන්නෙමි
එන්න මගෙ පුතේ එන්න මගෙ දුවේ
දෙස් විදෙස් සිසාරා මගෙ පෙම කියන්න
කැමැත්ත පවසන්නේ

මිදුම කියන්නට වහල් දනන් හට
සිර ගත වූ අය මුදවා ගන්නට
අන්ධ දනන් හට පෙනීම දෙන්නට
සමිඳු වසර පවසන්නට දුගිනට

දහම් දූපතේ උපත ලැබූ ඔබ
දහම දෙසන්නට මගෙ කැඳවුම ලැබ
වෙලා මං මූලා දුව යන ඔබ මොබ
රැස් කර ගනු දන මගෙ සෙවනේ සුබ



මුහුදු හතක් ඈතින් ඈති රටකට
සයුරු වලල්ලෙන් එපිට දූපතට
යවනට දහම් දූතයෙකු විලසට
කැමති ද දුව පුත ඔබ කැප වන්නට

මා පිය හිමි මා යැවූ විලසින්නේ
යවනට දන වෙත ඔබ කැඳවන්නේ
වැය වන එළියක් වී බැබලෙමින්නේ
මා ගැන ලෝකෙට කරුණු කියන්නේ

# 19

හිමිදිරි යාමේ පිණිකැට දිලිසෙනවා
සමිඳුගේ මුහුණේ හසරැල් මතුවෙනවා
ආදරේ නමින් ජීවිතේ පුදා
එදත් අදත් හෙටත් හිනා වෙලා
ජේසුනි මේ ඔබද – ජේසුනි මා ඔබේද
කියන්න ජේසුනි /// මා ඔබේද

ගිණි මද්දහනේ තණපත් මැලවෙනවා
දස දහසක් පව් මාගෙන් සිදුවෙනවා
ආදරේ නමින් පව් කමා වෙලා
රත්තරන් හදක් මටත් දෙන්න

නිසසල රැයෙහි ඔබව මතක් වෙනවා
කළ පව් සිහිවී මගේ හිත කකියනවා
ආදරේ නමින් සුසුම් මකා හදේ
ආදරේ මටත් කියා දෙන්න



## 20

මගේ දෑස ජේසුව දැක ගන්න
මගේ වචන ජේසුව පසසන්න //

මගේ සිරස ජේසුව  නමදින්න //
මගේ දෙපයින් ජේසු වෙතට යන්න
ජේසුනි ළං වෙන්න

මගේ අතින් ජේසු ගැන ලියන්න //
මගේ දෙපයින් ජේසු වෙතට යන්න
ජේසුනි ළං වෙන්න

ම’හද තුළ ජේසුනි රජවෙන්න //
මගේ දිව්යෙන් සුපුවත පවසන්න
ජේසුනි ළං වෙන්න



## 21

සමිඳේ ඔබෙ දෙපා සෙවණේ
දැහැන් ගතවන මේ සොඳුරු මොහොතේ

ජීවනය දෙන ඔබේ වචනය සදා සැනසුම වේ
සදා පවතින ඔබේ වචනය අප පහන් ටැඹ වේ

බලය ගෙන දෙන ඔබේ වචනය අපේ ශක්තිය වේ
හද පුබුදු වන ඔබේ වචනය අපේ ජීවය වේ



# 22

ඔබ හට ප්‍රසන්න දරුවෙක් වන්නට
සමිඳුනි මා හට දිරි දෙන්න
ඔබ හට ප්‍රසන්න දරුවෙක් වන්නට
සමිඳුනි මා හට අත දෙන්න

සමිඳේ සමිඳේ
මා හට මාවත පෙන්වන්න //

මේ සමාජය හරි නපුරුයි
නපුරා අප පසු පස එළවයි
එහෙත් සමිඳේ ඔබ මා සමගයි
බිය සැක නෑ ඔබ මට සවියයි

ආශා මිරිඟුව මා වටලයි
පාපය වෙත මා නිති කැඳවයි
එහෙත් සමිඳේ ඔබ මා අසලයි
සැම නපුරෙන් ඔබ මා මුදවයි



## 23

සමිඳුනේ සමිඳුනේ ඔබගේ දිවමන් වචනය
පහන් සිලක් වේ මාගේ දෙපයට
ඝණඳුරු මාවත මා සරණා විට
ඔබ විය මාගේ සරණය සැම දින //

ගං ඉවුරේ දියතේ වැජඹෙමිනා
තිසිකලටා තිසිඵල දෙවනා
නැ මිලිනව යන්නේ ඒ කිසිදා
වේ සුදනන් දිවියද එලෙසා //

සමිඳු නොහඳුනන පව්ටු දනෝ
සුළගෙ යන බොල් කරල් මෙනා
දුදනන් හා කිසිදා එක් නොවනා
සුදනන් ආසිරි නිති ලබනා //



## 24

ඝන අඳුරේ ඔබ ආලොකේ
මා දෙස නෙත් යොමා බලා සිටින්නේ
අසරණ මගේ සිත හඬනා හැම විට
ආදරෙන් ඔබ මා සනසන්නේ

පව්පිරි හදැතිව මා ලොව බිහිවී
ඔබ හමුවේ මා පව්කෙරුවේ
පිවිතුරු කළ මැන හිම වාගේ
ආනාගතේ මගේ ඔබ දැතේ

පාපය තුළ මා කඳුලැලි සලමින්
කිසිවෙකු නැහැ මා හා සමගින්
සමිඳුනී ඔබතුම පමනයි උරුමේ
නවතිනු මැන මා හා හද කුටියේ

තැලුනු බිඳුනු හද ඔබ ප්‍රිය කරනා
නැවෙන සිතැතියන් ගලවන්නා
නිර්මල සිත මත නැවතත් දුන මැනව
ආදරයෙන් මගේ හද පුරවා



# 25

සමරා බැතින් ලද ආසිරි
සමිඳුන් ගුණ ගයමු මෙලෙසේ
ඔල්වර නගව් – පැසසුම් කරව්
තුති ගීත ගයමින් මෙලෙසේ

තුති ප්‍රශංසා තුති ප්‍රශංසා
තුති ප්‍රශංසා තුති ප්‍රශංසා //

හද වේදනා ගිනිදැල් නිවා
ජීවය ලබාදුන් සමිඳා
පසසව් තිතින් – බැති ගී දමින්
විහිදා මුව සැමා සතොසින්

දිවි මං තලේ තනිවූ කලේ
අප අත් නොහරිනා සමිඳා
සදහම් සිතින් – තුති ගී දමින්
ගයමු පසස ගී අදරින්

අප ජීවයයි අප ශක්තියයි
සමිඳුන් සිඳ හෙළු සිරි ලේ
සුව ලත් හදින් – පැසසුම් නදින්
එක් වී ගයමු තුති මෙලෙසින්



## 26

පුදමි ඔබට ආදර සමිදේ මා සතු සැම දේ
භාර ගන්න තිලිණ ලෙසින් ඒ සියලුම දේ //

මගේ සිතත් මගේ කයත් සිතන පතන දේ //
භාර ගන්න තිලිණ ලෙසින් ඒ සියලුම දේ

දුබල මගේ මේ'මුළු දිවිය පඬුරක් ලෙසිනේ //
පුදමි ඔබට භාර ගන්න තිලිණයක් ලෙසිනේ



## 27

දෙව් පුත් ගිය මග දරුවන් යවනා
සදහම් සුවඳින් අප ඔප කරනා
පැවිදි සොයුරියන් හා පියවරු රකිනා
විලසින් පුදනෙමු සැමදා බැතිනා

මිස ඔබහට සමිඳේ කා හට පුද දෙම්දෝ
පිළිගෙන දෝතින් පු මිදි රස කරනා
දෙනු මැන ඔවුනට ඔබගෙ වරම් //

ඉදිරියේ ගමනට පියවර තබමින්
ශිල්ප දැනුම දී අප වෙත දැහැමින්
යහමග යවනා අප ගුරු දෙවිඳුන්
ඔබවෙත ගෙන එමු රකිනා විලසින්

දිවිමග දිනුමට හැම සෙත පානා
හෙළනා දහඩිය මුතුසේ වටිනා
මා පිය අපගේ දසදුක් විඳිනා
පුදනෙම් ඔබ වෙත මාපිය දෙදෙනා



## 28

ළමා අපෙන් ඔබට පිදෙන
යාගය සමිඳේ පිළිගන්න
මල් පළතුරු නැහැ දැල්වූ පහන් නැහැ
නොකිලිටි අපෙ සිත් පිළිගන්න
අසරණයන් තුළ ඔබ හඳුනා ගෙන
අප කළ යහපත පිළිගන්න
නිරතුරු ඔබගේ කැඩපත් වෙමු සමිඳේ //

අළුත්ම පැන්සල දෙකට කඩා ලියන්න දුන්නේ
අඟලක පැන්සල මෙතෙක් ලියූ එය විසි කෙරුවේ
සතුටු සිනාවකි ඉම්හිරියාවකි පහළ වූනේ
ඔබවයි සමිඳුනි මා දුටුවේ ඇයගේ මූවේ

පේර කෝට්ටුවෙන් රිම් එළවනු දැක “බෲෲම්” කියා
පැලේ ගෙදර දුප්පත් පොඩි දරුවා වැව් බැම්මේ
දිලිසෙන අළුත්ම බයිසිකලේ මගේ ඔහුව තියා
සතුටු අනන්තෙට ඉගිළ ගියා අපි එක පිම්මේ



# 29

වඳින වැඳිලි සමග දෙවිඳේ ඔබට වඳින්නම්
යදින යැදිලි සමග දෙවිඳේ ඔබට ඇදෙන්නම්
දෙවිඳේ ඔබට ඇදෙන්නම්



වඳින යැදිලි සැවොම දෙවිඳේ ඔබට පුදන්නම්
සිතන සිතුම් ජීවිතයේ ඔබට පුදන්නම්
දෙවිඳේ ඔබට පුදන්නම්
පුදමු පුදමු පුදමු පඬුරු
වඳිමු වඳිමු වඳිමු දෙවිඳු //

හැදුව වැඩුව දෙමා පියන් ඔබට පුදන්නම්
එකකුසහොත් සොහොවුරු කැල ඔබට පුදන්නම්
සැවොම ඔබට පුදන්නම්
එකමුතු කිතු පවුල් දිවියෙ මහිමෙ කියන්නම්
ඔබේ දේව පවුල ලොවේ උදාකරන්නම්
කැපවී උදාකරන්නම්
පුදමු පුදමු පුදමු පඬුරු
වඳිමු වඳිමු වඳිමු දෙවිඳු //

සිප් සත දුන් ගුරු උතුමන් ඔබට පුදන්නම්
හදවත දිනූ යහළු යෙහෙලි ඔබට පුදන්නම්
එකමුතු කිතු පවුල් දිවියෙ මහිමෙ කියන්නම්
ඔබේ දේව පවුල ලොවේ උදාකරන්නම්
කැපවී උදාකරන්නම්
පුදමු පුදමු පුදමු පඬුරු
වඳිමු වඳිමු වඳිමු දෙවිඳු //



## 30

සුදු මලක් වෙලා මම මේ ලොවේ
ජීවිත සරසන්නයි
මල් මිටක් වෙලා මම සැම දෝතේ
පිදිලා මැලවෙන්නයි
මල් මාලයක් වී ගෙල සරසා
සිපගෙන රැව වෙන්නයි
මගේ ප්‍රාර්ථනා මේ ජීවිතේ
යාගික ආදරයයි

ලස්සනයි ලොව ලස්සනයි – මිනිසුන් මල් වුනදා
ලස්සනයි ලොව ලස්සනයි – අප මිනිසුන් වුනදා

සුව සිනහා මවා වත පෙමින් පුරා – සිරියා පතුරම්නා
මුතු කඳුළු නෙතේ පිස දමා පෙමින් – සතසම් අඬන දනා
ගිනි සුසුම් නිවා අවගති සිඳිමින් – අවියක් මම වෙම්නා
මගෙ ප්‍රාර්ථනා මේ ජීවිතේ – යාගික ආදරයයි

සැනසුමක් වෙලා මම මඳ සුළගේ
සැනසුම ගෙන හඳිනා
තනි අතක් අරන් මුදු දයා පෙමින්
පතුරම් සෙනෙහෙ සදා
සැනසුම් වදනින් සෙවු පෙම් දහමින්
කිතු දෙව් පෙරුම් පුරා
මගේ ප්‍රාර්ථනා මේ ජීවිතේ
යාගික ආදරයයි

# 31

සුරලෝ මඩලේ වැඩ සිටින පියේ
සැරදේ  ඔබේ සිරි නාමේ
පැමිණේවි මෙලොවේ ඔබ රජ දහනේ
ඉටුවේ ඔබේ අණ දෙව්දේ
දින දින අපේ බත දෙනු මැන සමිදේ
අපෙ පව් සැම කමනු මැනේ
අන් අය ගැන අප ඉවසන ලෙසිනේ
විපතින් අප මුදනු මැනේ //



## 32

නොබා සිටිනට හැක්කෙ කොතැනද
දැනුම නිවහල් වූනේ කොතැනද
අපමණ නිපැයු භේදයෙන් රට
කැබලි වී නොම යන්නෙ කොතැනද

අන්න ඒ රන් නිදහසේ දිව්‍යමය දේශය කරා
මගේ දේශය අවදි කළ මැන පියාණනේ

සත්‍යයේ ඇති ගැඹුරු පත්ලෙන්
වදන් වැල් නැඟ එන්නෙ කොතැනද
වෙහෙස නොබලන දිරිය දෑතක්
පාරිශුද්ධිය කරා නැගුණිද

සම්ප්‍රදායික වියළි කතරක
දැක්ම ගඟුලක් වන්නෙ කොතැනද
චින්තනය නිති පුළුල් වන විට
ක්‍රියාවද එහි රුඳෙනු කොතැනද



# 33

සමිඳුනි මා දිනූ රට ඔබගෙයි
මේ රට මට ඔබගේ සිරුරයි
ඒ සිරුරෙන් ජීවය ලබනා
ඒ සිරුරේ අනුවකිය මෙමා

දුකම උහුලන දුකම විඳවන
දුගී දන අතරේ
කඳුළු වන්නේ රුධිරයමයි
එකම කිතු සිරුරේ

උතුර දකුණක වෙනස නොමැති
මියෙන සැම අතරේ
ගලා යන්නේ රුධිරයමයි
එකම කිතු සිරුරේ

වියලි කතරක් බවට පත්වන
රත්තරන් පොළවේ
සිඳී යන්නේ රුධිරයමයි
එකම කිතු සිරුරේ



# 34

මා හා ගමන් ගන්නාවූ – යාවේ දෙවිතුමා ඔබම වේ
මාගේ හදවතේ – අසුන් ගන්න දෙවිතුමා ඔබයි //

මා හා වැඩ කරන්නාවූ – යාවේ දෙවිතුමා ඔබම වේ
මාගේ වැඩපලේ – වැඩකරනා දෙවිතුමා ඔබයි //

මා හා සතුටු වන්නාවූ – යාවේ දෙවිතුමා ඔබම වේ
මාගේ නෙත් දෙකේ – කඳුළු පිසින දෙවිතුමා ඔබයි //

මා හා දුක් විඳින්නාවූ – යාවේ දෙවිතුමා ඔබම වේ
මාගේ කරදරේ – සිත සනසන දෙවිතුමා ඔබයි //

මා හා පෙරටු යන්නාවූ – යාවේ දෙවිතුමා ඔබම වේ
මාගේ දිවි මගේ – මග දක්වන දෙවිතුමා ඔබයි //



# 35

ජීවිතයට ආලෝකය දෙව්ඳුනේ ඔබයි
ජීවිතයේ විඩා නිවන නවාතැන් පොළයි

ජේසු සමිඳුනේ
ප්‍රේමයාණනේ
නමස්කාර වේ //

තැවුල් දුක් නිවා සනසන ආදරේ ඔබයි
මහද සතුටු සිනා මවන අරුණ උදාවයි

සතුරු උවදුරින් සුරකින පවුරු බිත ඔබයි
නිසරු දිවිය සරු කරවන සිහිල් දිය පොදයි

මිහිමත සත්වග නංවන ජීව උල්පතයි
සදා ජීවනයේ පිරිපුන් පරම සත්‍යයයි

පාප අඳුර නසන මගේ දෙවිතුමා ඔබයි
පැතුම් පුබුදු කරන මගේ ලොවේ හිරු සඳුයි

# 36

නීල ආකාසේ විය හැකි විට වලාකුලක සැඟවී
සාගරේ දිය ඇල්ල නොවී ජල බිංදුවේ නැවතී
කන්ද මුදුනට නගින්න නොබියව පාමුල නොම නැවති
දුන්න දේ දෙවිඳුන් වෙතටම දෙමු තව තව එයි ඔපවී

මා මිතුරේ මිතුරියේ සොහොයුරු සොහොයුරියේ
තලෙන්තු දෙවිඳුන්ගේ අගය කරමු දෙගුණේ
දේව පියාගේ දරුවන් ලෙස යමු ඉදිරියටම දියුණේ //

එලියක් දැල්විය හැකිනම් කරන්න එපා සාප අඳුරේ
පර්වතයක් විය හැකිනම් වෙන්නට එපා වැල්ල සයුරේ
සැඟවී ඉන්නට සඟවා ගන්නට නොවෙයි කියා ඇත්තේ
සූරුකම් විරුකම් වඩා වඩමු අපි හිතැහී ලොව මත්තේ //

# 37

රාජාලියකගේ තටුමත මා හා හිඳුවා
මා සැමදා සුරකී දිවි තිබෙන තුරා

මා හා සැම දිනේ හිමි ඔබ සිටින නිසා
සාමය මා'හද තුලේ ජනිතව ඔබට බැඳේ

මාගේ මේ දිවියේ ඔබ මා රකින නිසා
මගේ මුළු දිවියේදී ඔබ හට තුති පුදමි

බිය නොම වී කිසි දා ඉදිරිය වෙත මැ බලා
ඔබේ සැලසුම එලෙසේ මා තුළ ඉටුවේවා

නෙක කරදර මැද දී කිසි දින මා නොසැලී
බාධක මැද දිරි දී මා සවිමත් කෙරුවෝ

ජලයේ සැඩ පහරේ තපුරේ මා මුදවා
කරදර විපතේදී සුරකින දෙවි ඔබ වේ

ලෙඩ දුක් කටු අතරේ කිසි දින නොම ළතැවී
ඔබෙ සැනසුම හමුවේ ජීවන සතුට ලැබේ

පිපසු මගේ සිඳුවා ජීවන ජල ලැබ දී
කුසගිනි නිවනු ඇතේ ජීවන බොජුන් කවා

## 38

ආදර මගේ ජේසුනි කලකින් ඔබ අමතමි
කොහොමද ඔබගේ තතු සමිඳේ
සිතු සිතු දේ මම කළා ඔබ දහමේ ගුණ නසා
අද ඔබ ළඟ වැඳ වැටී හඬමි

මා හසුව් මාරුතේ මග වැරදී මාවතේ
මේ ලියමන ලියමි මා සමිඳේ
මහ කරුණා සාගරේ ඔබ පමණයි ආදරේ
සැනසුම මට දෙන්නකෝ සමිඳේ
ජේසුනි මම ආදරෙයි ඔබෙ පෙම ඊටත් වැඩියි
සැමදා මම ණය ගැතියි ඔබට
ඔබ දුන් හැමදේටමත් මට දුන් නැති දේ හටත්
තුති පුදනෙමි ආදරෙන් සමිඳේ

ආදරේ මගේ ජේසුනි හමුවෙමු යළි මතු දිනේ
දින දින වැජඹේ ලොවේ සමිඳේ
සිතු සිතු දේ මම කළා ඔබ අනුකම්පා කළා
මම ඔබ ළඟ වැඳ වැටී හඬමි

# 39

බිංදු බිංදු එකතු වෙලා දිය පාරක් සේ සැදිලා
ගල් පර නොතකා නොසැලි මුහුදට යන්නා වාගේ
එන්න යන්න ජේසු වෙතට යාළුවේ

නංගි මල්ලිලා ගන්න අත්වැල් අල්ලා
සොයමු සොයමු ජේසු කොහෙද යාළුවේ
එන්න යන්න ජේසු වෙතට යාළුවේ

අහසත් කළුවර කරලා වැස්සක අඳුරක් මවලා
තිබුනත් ඉර හඳ නොසැලී එළියක් දෙන්නා වාගේ
ලොවට දහම් එළිය බෙදමු යාළුවේ

අපි අකීකරුයි කියලා කියන්න ඉඩ නොම තියලා
කිකරු කඩිසර කරුණා ගුණ පිරුණු ළමයි වාගේ
හොඳ ළමයෙකු වෙන්න බලමු යාළුවේ
හොඳ ගතිගුණ එක්ව වඩමු යාළුවේ

## 40

ඔබ තුරුලට  වී ඉන්නට ඇත්නම්
එක වරුවක් හෝ දවසකදී
නිසසල මොහොතක හිමිදිරි උදයක
ඔබ සිරුරේ උණුසුමේ වෙලි
ජේසුනී මට ඔබ විශ්වාසයි ඔබ මගේ ජීවිතයයි
හැමදාමත් එහෙමයි – ඔබ තුරුලට වී

ගිනිගත් සිතිවිලි නිවෙනා තුරු මා ඔබ තුරුලේ ඉන්නම්
පව්වූ මගේ සිත සේදී යනතුරු ඔබ පා නමදින්නම්
තනි වෙන්නට කිසි දිනක ඉඩ නොදී ඔබ පසුපස එන්නම්
දෑතින් ඔබේ අත අල්ලාගෙන මා ගීයක් මුමුනන්නම්

දුකින් පෙලෙන මිනිසුන් අහුරක් ගෙන ඔබ පාමුල වැටෙම්
සැනසීමක් අයැදින්නට හිත හිත මල් දෝතක් පුදම්
විශ්වාසයි මට විශ්වාසයි කිසි දින මා අත නොහරියි
ඔබ දුන් හුස්මෙන් ජීවත් වන්නට මට දිරි ලැබෙනු ඇති

# 41

ඉඩ දෙන්නම් සමිඳුනේ – මගේ හදේ
ජනිත කරන්නට කුටියක් ඔබහට – ආදරේ ////

රැඳී සිටින්නට සැමදා ඔබ තුළ
බහ දී ඔබහට පිරිපුන් ප්‍රේමෙට //
මගේ හද මඩල සදා //

වෙව්ලන කකියන පුපුරන දෙරන
පාලු හදවතේ දෝංකාරයෙකි //
මගේ හද මඩල සදා //

ජීවකයාණෙනී පෙම් ඇදුරාණෙනි
ලැගුම් ගත මැනවි මගේ හදගැබේ //
ප්‍රේමයේ හිමියණේ //

## 42

හා...
කළ නොහැකි කිසවක් නැතේ දෙවියන් වහන්සේට //
කවුරුදෝ! කවුරුදෝ! දැනගත්තේ ඒ රහස //

දෙවියන් වහන්සේට // සියල්ල කළ හැකිය
හා... මිනිස් මනසකින් බැලුව ද නොහැකිය

දෙවිඳුන් මත යැපුනොත් එය ඇහැකිය //
මරිමවු බහ දුන්නේ දෙව් හඬටයි
දෙව්පුත කුස පිළිසිඳුනේ ඒ ලෙසටයි

හා... වචනයේ දාසිය වන්නට බහදී
යාගවූනා පුතු සමඟින් මරිමව් //
ගැලවීමේ දෙව් සලකුණ කුරුසිය
මහත් සතුටකින් පිළිගත්තා ඇය

# 43

මට දරන්න බෑ ජේසුනී ඔබේ ආදරේ
දෙනෙතින් කඳුලැලි ගලනවා මගේ ජේසුනී
මට කියන්න බෑ වචනයෙන් මගේ ජේසුනී
හදවත ඉකිබිඳ හඬනවා මගේ ජේසුනී
මට වචන නෑ ඔබේ ගුණ ගයන්න ජේසුනී
මං ආදරෙයි ආදරෙයි සුදු ජේසුනී මං ආදරෙයි...

සහනය සොයා ලෝකයේ මා ඉගිලුනා
මා රැවටුනා සැමදා මා තනිවුනා
හද පැරුනා වේදනාවෙන් මිරිකුනා
සිත කැලඹුනා පාපයේ මා සැඟවුනා

මගෙමයි කියා ආදරේ කල සැම දෙනා
මා හැර ගියා ජීවිතේ මට තේරුනා
ඔබ හමුවුනා ආදරේ දැක හිනැහුනා
හද සැනසුනා ජේසුනි ඔබ ළංවුනා

# 44

නටන රැළි වගේ මුහුදෙ වෙරළ ළංවෙලා
සිඹිම් ඔබ දෙපා සම්දෙ ඔබට ළංවෙලා
පිපෙන පියුම සේ ලොව ම සුවඳ ගන්වලා
වඩිනු මැනවි මහද තුළට මා සුවඳ ලා

පායන හිරු සේ මා අඳුර බිඳ දමා
වඩින ජේසුනේ දයා වඳිනෙමි ඔබ මා

අඳුර මැකෙන සේ හිරුගෙ එළිය පැතිරීලා
මකනු මැන මගේ දුගුණ දෙවිඳු බලය පා
ලොව ම පිරෙන සේ  හිරුගෙ එළිය පැතිරීලා
පුරවනු මැන ඔබ එළියෙන් මා සුගුණ ලා

තමන් රිසි ලෙසේ අඹන කුඹල් කරු ලෙසේ
අඹනු මැන මගේ දිවිය ඔබ කැමති ලෙසේ
නදී දිය ඇදී  සයුර තුළ සැඟ වෙන සේ
ඔබ දිවියෙහි සඟවනු මැන මා ඒ ලෙසේ

## 45

ජේසුනි මගෙ දිවිය එළියක් කළ මැනව
අඹරේ දිලිසෙන – රිදියෙන් තිමැවුන
නොනිවෙන තරුවක් සේ

ඔබගේ වරම් ලැබ වැඩෙම් මෙමා
සරණ වෙන්නෙ මගෙ සොයුරු සැමා

ජේසුනි මගෙ දිවිය පඬුරක් කළ මැනව
උදයේ පොපියන – බඹරුන් රොක්වන
සුවඳැති පියුමක් සේ

ජේසුනි මගෙ දිවිය වරමක් කළ මැනව
සැමහට හිමිවන – සගයට ගෙන යන
ඔබේ පෙම් තිළිනක් සේ

ජේසුනි මගෙ දිවිය පියුමක් කළ මැනව
පව් දොස දුරලන – ජීවය ගෙන දෙන
කුරුසියෙ යාගය සේ

## 46

සමිඳුනි ඔබ මට රැකවරණය වේවා
මාගේ දිවියේ ගැටෙනා
බාධක සිඳ බිඳලා
පෙරටම යන්නට සමිඳුනි ඔබ මට වාසනා වේවා

දුබල මිනිස් වග පාපෙන් ගලවා
ගන්නට ඔබ තුම දිවි දුන්නේ
ඔබ පෑ යහමඟ පියමන් කරනට
සමිඳුනි මට වෙනු මැන සරණේ

දිව පූජය තුල සිරකරුවෙකු ලෙස
මා හද මැදුරට ඔබ තුළු වී
මකා දමා මා පව් ඝණ අඳුරා
පිරිසුදු කළ මැන කිතු සමිඳේ

බාධක හමුවේ නොසැලි සිටින්නට
මා දිරිමත් කළ මැන සමිඳේ
මිනිසත් කම පෙරදැරි මෙහෙවරකට
සවිබල දුන මැන සමිඳේ

නින්දා අවමන් දුක් කරදර මැද
අසරණයකු විලසින් ළතැවී
සිටි මා තැවතත්  පුබුදු කළේ දෙවි
වදනේ ශක්තිය මට ලැබ දී

# 47

දුක් කරදර කුරුසිය මට එපා
කියා හඬා කෑ ගසන්න සිතුනා
කල්වාරිය කුරුසිය මට පෙනුනා
අයැදු දෙස නුසුදුසු බව ගැගුනා

ගොල්ගොතාව අපගේ දිවියේ
කුරුසියේ යාගික දිවි ගමනයි
රළු මඟ බාධක කටුකොහොලයි
සිත කැමතියි ගත දුබලයි

අතුල් පහර විඳිනට සිදුවේ
නින්දා අපහාස මදනොවේ
සීමොන්ලා අල්ප අද ලොවේ
අපි හරි අසරණයි ජේසුනී

නිරුවත් කරමින් ඔබ කුරුසේ
මරියදාව සිඳ බිඳ ලූවේ
අනුන්ගේ හොඳ නම කෙලසන්නෝ
සමිඳුන් නිරුවත් කරලන්නෝ

මරණය ජයගත් කිතු සමිඳේ
පාපය පරදා එතෙර වුනේ
අප තවමත් පව් ඝණ අඳුරේ
එතෙර කරනු මැන අප සමිඳේ

# 48

ජේසුනි ඔබ ඉස්සර වෙලා – කුරුසියක් ගෙන ගමන් කළා
පසු පසින් එන මා දෙස බලා – සිනාසී මා සවිමත් කළා

වේදනා තුළ සිරවෙන්නෙපා – කඳුලින් අන්දව
ළතවෙන්නෙපා
සුසුමන් මැද මඳ සිනහා පපා – සැනසෙන්න සනසන්න

වේදනා සිත පුරවන්නෙපා – මැසිවිලි මුව මත
තවරන්නෙපා
කොඳුරන සිත මැද සිනහා පපා – සැනසෙන්න සනසන්න

## 49

නිති අප සුරකින අපගේ දිවියේ – එකම එඬේරාණෝ
අපව වසා ඇති අඳුර දවාලන – එකම සූර්‍යයාණෝ

ජයෙන් ජයම වේ// ජය ශ්‍රී රජිඳාණෝ
ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ අප දිවියේ
එකම ස්වාමියාණෝ ආමෙන් ආලේලූයියා

සිටිනත් අනන්ත රජවරු නායක – චින්තන උගතු ලොවේ
ඔබේ ශ්‍රී නාමේට සමවූ නාමයක් – අද නැත අපගේ දිවේ

ඔබට ඔබම හැර සමවිය හැක්කෙක් – නැත මෙතුවක් දැක්කේ
ඊයේ අද වගේ හෙටත් ඔබ සදා – අසම සමයි ලෝකේ

වචනේ තුමාණෝ මාංශවත්වී – අප දිනූ බව ඇත්තයි
අපව මරාලන මරනෙ මරාගෙන – ජේසුස් ජයගත්තයි

නිදහසක් නොමැති නිදහසක් සොයා – නිදහසේ අප දිව්වේ
ජේසුනි ඔබේනුයි නියම නිදහසේ – ජය පැන් අප බිව්වේ

# 50

මගේ දිවි පණ නල රකින්නේ – ඔබ පමණකි ජේසුනි
දිවිය පුරා ඔබ ආලෝකේ – සැම නපුරේ සරණේ

මිලින වෙලා දිවි පැතුමන් බොඳවී යන මොහොතේ
නිහඬ වෙලා කිම ඔබ ගොළුවී
වඩිනු මැනේ බලාපොරොත්තුව හදවෙත කැන්දා
පහස දැනේ සතුටද ඉතිරේ

ඔබ හැර මා අන් හවරෙකු වෙත යන්නද සම්දේ
ඔබමයි මා නිති පිළිසරණේ
නැත කිසිදා කුරුසේ බර හැරදා පසු බැස්සේ
දිවිය ඔබේ දිරියයි නිබඳේ

ඔබ ඇසුරේ කිම සම්දුනි මෙතරම් සුව සහනේ
නැත ලැබුවේ වෙන කිසිවකු ඇසුරේ
මට නනි නැ ඔබ හා මා යන මේ දිවි කතරේ
විඩා නිවේ ඔබ උණුසුම් තුරුලේ

සරා සඳේ සොමි කැල්මන් ගලනා හෝරාවේ
පිළිසඳරේ සතුටින් නැවතී
දිවිය පුරා මට ආනන්දය වූ සැටි සිහිගන්වා
රැඳෙමි ඔබේ නෙතු කැන් අතරේ

අවර ගිරේ රළ පෙළ විත් වෙරලේ හැපෙනාසේ
ඔබට ඇදි දිවි රස ගන්වා

# අරුණෝදේ අකුලක පිපෙනා මල් පොකුරක් වී
# පවනේ සැලී යලි ගත දැවටෙන්නේ

## 51

අදහම් දිව්‍ය සත්ප්‍රසාදෙනි – බැතියෙන් සමරම් ස්වර්ග
රන් නිධානෙනි
ජීවත් කරමි මගේ ජීවිතෙන් – ජේසු ක්‍රිස්තු සමිඳු දිව්‍ය
සත්ප්‍රසාදෙනි

ස්වර්ග අසිරි සිරිය ඔබයි දිව්‍ය සත්ප්‍රසාදෙනි
පරම අමිල වරම ඔබ සුරම්‍ය සුර විමානෙනි
සංතෘප්ත වී ඒ අසිරියෙන්
පාප සාප දුරුකරන්න අසිරියක් වෙමි

ස්වර්ගයෙන් සැපත්වූ අමිල බොදුන ඔබයි සමිඳුනි
බොදුන බුදින සුදන කිසිම දිනක නොදනි කුසගිනි
සංතෘප්ත වී ඒ භෝජනෙන්
දුගී පැලක ඉදෙන බතක රහස මම වෙමි

ගොල්ගොතාව කුරුස කන්දේ ගැලුව රුධිර ජේසුනි
රුගෙන බොන්න රාත්‍රී භෝජනේදි දුන්නු පාත්‍රෙනි
සංතෘප්ත වී ඒ රුධිරයෙන්
පවස නිවන දිය දෝතක රහස මම වෙමි

වික්‍රමාන්විතෙන්ම අසුන් අරන බැටළු පොව්වනි
අග්‍ර ස්වර්ග දූත මරිවමුන් ද ශුද්ධවන්තෙනි
සංතෘප්ත වී ඒ නිමෙශයෙන්
ස්වර්ග මිහිර දැන්ම විඳිමු සත්ප්‍රසාදෙයෙන්

## 52

ඔබ තෝරාගත් ඔබගේ රජයේ අපි රාජ්‍ය ජනතාවයි
ඔබ කැඳවාලූ ඔබ සේවාවේ අපි පූජක ජනතාවයි
ඔබෙන් වරම් ලද ඔබගේ වචනේ අපි දිවැසියෙ ජනතාවයි

සියල් පැවැත්මෙහි පැවැත්මයාණනි
ඔබේ ශ්‍රී නාමෙට හෝසානා
රජය ද බලය ද මහිමෙ ද ඔබගෙයි
ඔබේ ශ්‍රී නාමෙට – හෝසානා ////

විශ්ව විජය ලද විශ්ව සමිඳු සෙවනේ විශ්වාසයේ
ජනතාවයි
අතීන්ද්‍රිය කිතු සමිඳුගේ සිරි සිරුරේ අපි ප්‍රේමයේ
ජනතාවයි
සග දිවියෙන් බැඳි බලාපොරොත්තුවෙහි අපි පෙරමග
ජනතාවයි

# 53

දස මස මා ඔබෙ කුසේ දරා – මා හැදූ මගේ අම්මා
තුරුලෙ හොවාලා මා ඇති දැඩි කල – මගේ ආදර අම්මා

ආදර දෙව් සමිඳේ – මගේ ආදර අම්මා
ඔබගේ රැකවරණේ – සුරකිනු මැන සැම දා

දුක් කරදර මැද වෙහෙස දරා – මා හැදූ මගේ තාත්තා
දහඩිය හෙළලා මා ඇති දැඩි කල – මගේ ආදර තාත්තා

නොයෙකුත් බාධක සිඳ බිඳ ලා – මගේ මව් පිය දෙන්නා
සැමදා දෙවිඳුන් රැකවරණය තුළ – වැජඹේවා සැම දා

## 54

බාලයන් මා වෙතට එන්න ඉඩදෙනු
කියා අමතලා අප සැමා
දහම් දෙසන්න පතුරුවන්න යන්න සැමදෙසේ
කියයි අදත් ඒ ජේසුතුමා

විශ්වාසයේ පහන් වෙමු අපි
ලෝක අන්ධකාරයන් නසා //
බෙදාගන්නටා බෙදාදෙන්නටා අප යවන්නේ ජේසුතුමා

අපේ දෙමාපියන් අපේම සොහොයුරන්
ගුරුන් යහළුවන් යෙහෙළියන් //
සදා චාරයේ රැඳී පුදන්නෙමු මේ ප්‍රේමයේ සේවයෙන්

# 55

නවමු පණක් ලබලා – නවමු ලොවක් සොයලා
සම්බුදුන් දහමින් සවිය ලබා අපි – යමු නම ලොවක් සොයා

පැරණි සම්මතය සිඳ බිඳ ලන්නට – නව පේරුසලමක්
ගොඩ නංවන්නට
පෙරට එන්න සැවොමා – අපි යමු නව ලොවක් සොයා

දැයේ කිතුණු කම වටහා ගන්නට – දිවැසි මෙහෙවරක
නිති තියැලෙන්නට
පෙරට එන්න සැවොමා – අපි යමු නව ලොවක් සොයා

එක අවරල්ලක එකම තලාවක – එකට වෙසෙන අපි
කුමට සටන් වැද
එක්වෙමු භේද වරා – අපි යමු නව ලොවක් සොයා

## 56

ශුද්ධාත්මෙණි //// වස්වාලමින් ඔබේ වරම්
මා ජීවිතේ පුරවන් ඔබේ ආලෝකයෙන්

පිරිපුන් ප්‍රේමෙන් තුළ වැඩවසනා ශුද්ධාත්මෙනි
සත් වරමින් අප පහන් කරනු මැන ශුද්ධාත්මෙනි
ඔබ අහිමත අප සැලසුම් කල මැන
ආලෝකය වී යනෙනා මග දිග

ජීවිතයේ මග පහදා දෙනු මැන සමිඳුනේ
වියවුල් මගිනුත් ගලවා දෙනු මැන සමිඳුනේ
නැණ නුවණින් ඔබ මග වටහා දේ
ආලෝකය වී අප දිවි ගමනට

# 57

ශුද්ධාත්මයාණෙනි වඩිනු මැනේ
ඔබේ වරම් රැගෙනේ
මුළු ලෝ ලදත් මට නෑ පලේ
නොලදොත් ඔබේ බලේ

ඔබේ උදව් පියේ – නොලද්දොතින් මෙමා
කිතුන් හදේ පැතුම් – ලබා ගනිම් කෙසේ
නොයෙක් වරම් – ඔබේ අතේම වේ
එතුම් වරම් ඔබෙන් – ලැබේ දනන් වෙතේ

සිටින්නෙ කොයි තැනේ – එතැන්හි සාමෙ වේ
දා ගුණේ අගේ – ඔබේ හදින් නැගේ
ශක්තියේ සුවේ ඔබයි අපේ පියේ
සුසිත් දනන් වෙතේ දයා වෙවා පියේ

# 58

ශුද්ධාත්මයාණනි // සුදනුම් වරම් රැගෙනේ
වඩින්න අප වෙත //

ප්‍රඥාව දැනගැන්ම - දැනමුතුකම දේව භය
තේරුම් ගැනීම ධෛර්‍යය - දේව භක්තිය
දෙන්න අප වෙත

අතුලාන්ත සිත් සුවය - ලැබ දෙන්න අප හදට
පුරවා ඔබේ ශුද්ධාත්මයෙන් - සුවයෙ බලේ රැගෙන
වඩින්න අප වෙත

පාපයේ වහල් කරන - දෙවිඳුන් ඈත් කරන
නපුරේ බලේ සිඳ බිඳලන්න - ශක්තිය ලැබ දෙන්න
නපුරාව ජයගන්න

# 59

ජීවනයෙ සම්දා ජල මතු පිට සරනා – අනාදියේ හිස් බව
දුරලා ලූ
නවමු මැවිල්ලක මග පහදා ලූ – ශුද්ධාත්මයාණෙනි ///

සහනය දෙන සම්දා අප තුළ වැඩ සිටිනා
හිස්වන්නම් අප ඔබෙන් පිරෙන්නට
නව  මිනිසෙක් අප තුළ ගොඩනගනට

ශුද්ධාත්මයාණෙනි ///
සත් වරම් රැගෙනා වඩිනු මැනවි සම්දේ
දහම් රසින් අප දිවි පුරවන්නට
සුපුවත දස අත පතුරාලන්නට
ශුද්ධාත්මයාණෙනි ///

# 60

මගේ හද සමිඳුන් මහිමය පසසයි – මගේ සිත දෙවිඳුන් වෙත උදම් අනයි
කුළුණු ගුණේ පා සිය දාසියටා – දෙවිඳාණන් මා අසිරි වැඩුවා //

දෙවිඳු ප්‍රසංශා වේ ////

පැරකුම් සමිඳුන් දැසි මා උදෙසා – ඉමහත් දේ කල සැටි සිහි කරලා
පරසිදු සමිඳුන් කී ඒ ලෙසටා – පුන්‍යවන්ත වීමට වර ලැබුනා //

එතුමන් දයාව බැතිමත් දනටා – කුලෙන් කුලට නැග ඒ විකුමන් පා
උඩඟු දනන් පොළොවට විසිකෙරුවා – දීන දසුන් අහසට ඔසවාලා //

සාගිනි වූවන් යහගුණ කවලා – ධනවත් අය නිතැතින් හිස් කරලා
ආබ්‍රහාම් හට පැවසූ ලෙසිනා – ඊශ්‍රායෙලුන් හට කරුණා පැවා //

පිත් පුත් සුදතුන් තෙරුවන් දෙවිඳුන් – හට සැම කල්හිම තුති ගොස වේවා
අනාදියේ වූ ලෙස නිති දිනයේ – එලෙසම වේවා එලෙසම

# වේවා //

## 61

වචනයේ දාසියයි මරිය මවේ
සම්මතය හැර දැමූ ළඳ ඔබයි
අසම්මත වූ දේව සැලසුම
වටහා ගත් අම්මා

අම්මා අම්මා ඔබයි අපේ අම්මා
ධනයට බලයට දාසියක් නොවී
හිස්වී සැමකින් දෙවි බවින් පිරී
අලුත් මැවිල්ලක් කැඩපතවූ
විශ්වයේ මව අම්මා
අම්මා අම්මා විශ්වයේ මව අම්මා

කැපවී වැයවී දෙවි කැමැත්ත සොයා
වචනය තෙමවූ සත්‍ය කුස දැරුවා
කඩු හතකින් හද සිදුරු කරන්නට
ඉඩ දුන් ළඳ අම්මා
අම්මා අම්මා ඉඩ දුන් ළඳ අම්මා

මරි මව් විලසින් සුදනුම් මග සොයමු
දෙවි කැමැත්තට සැම විට හිස නමමු
ඔබ ගිය මග අප මග වන  දවසේ
අපිත් ඔබේ දරුවෝ
අම්මා අම්මා අපිත් ඔබේ දරුවෝ

# 62. සාමය වෙනුවෙන් යාච්ඤාව

ස්වාමිනි මා ඔබේ සාමයේ උපකරණයක් කළ මැනව.
වෛරය පිරුණු තැනට ප්‍රේමය ද,
අසමගියේ තුවාලයන්ට ශාන්තියේ සුවය ද,
අවිශ්වාසයෙන් යුත් තැනට විශ්වාසය ද,
බලාපොරොත්තුව සුන් තැනට බලාපොරොත්තුව ද,
ශෝකය වටලාගත් තැනට ප්‍රීතිය ද,
ගෙන යාමට වරම් දුන මැනව.

දිව්‍ය ගුරුතුමාණෙනි,
සැනසීම ලැබීමට වඩා සැනසීම දීමට ද,
තේරුම් ගනු ලබනවාට වඩා තේරුම් ගැනීමට ද,
ප්‍රේමය ලැබීමට වඩා ප්‍රේමය කිරීමට ද,
මා යොමු කළ මැනව.

මක්නිසාද, දීමෙන් ලැබීමත්,
සමාව දීමෙන් සමාවත්,
මරණයෙන් අපට
සදා ජීවිතයට ඉපදීමත් අත්වන හෙයිනි.
ආමෙන්.



SRI LANKAN COMMUNITY IN SINGAPORE

WEB

PDF

*www.srilankancatholics.org*